# මහාමායා විද්‍යාල ගීය

නමදිමු නමදිමු බැති පෙම් දල්වා
අප පෙම්බර විදුහල් මාතා
සොඳුරු මහාමායා මාතා
මියුරු මහාමායා මාතා

විදු එළියෙන් අප නැණ දල්වා
දැ ගතියෙන් අප දිරි ගන්වා
යහ මග අප හට පෙන්වන නිරතුරු
පහන් තරුව ඔබ මැයි මාතා

මව්බිම සිරිසර පණ ගන්වා
ලලිත කලා රස හුරු කරවා
අප දිවි මග සරු කොට මල් ගන්වන
තෝතැන්නත් ඔබ මැයි මාතා

සම්මා සම්බුදු සසුන් කෙතේ
සරු පල දී නිති අපේ සිතේ
දෙලොව දිනන මග අප හට පෙන්වන
දහම් පොතත් ඔබ මැයි මාතා

ඔබ නම දිනෑ දිනෑ බැබළේවා!
ඔබ යන මග මල් පිබිදේවා!
අප යන යන සැම තැන ඔබ සිරි නම
සුමගට අප හට ගුරු වේවා!